**COPE සහ COPA පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් USAID සමුළුවකට**

මාර්තු 14 , 2016 : පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව, සහ රාජ්‍ය ගිණුම් පිළිබඳ කාරක සභාව නියෝජනය කරමින් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්, විගණකාධිපති, සහ මුදල් අමාත්‍යාංශයේ සහ විගණකාධිපති දෙපාර්තමේන්තුවේ නිළධාරීන් ජාත්‍යන්තර සංවර්ධනය සඳහා වූ එක්සත් ජනපද ආයතනයේ (USAID) අනුග්‍රහය මත පවත්වන ලද එක් දින සමුළුවකට මාර්තු 5 දින සහභාගි වූහ. මෙම සමුළුව ශ්‍රී ලංකා රජයේ සමස්ත විනිවිදභාවය, වගවීම සහ කාර්යක්ෂමතාව තව තවත් ශක්තිමත් කිරීම සඳහා උපකාරී වේ. මෙම සමුළුව ගරු කරු ජයසූරිය මහතා - කථානායක ; ධම්මික දසනායක මහතා - ප්‍රධාන ලේකම් , ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව ; ගරු ලසන්ත අලගියවන්න - රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව (COPA) සභාපති; ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා - පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව (COPE) සභාපති ; සහ රීඩ් අයෂම්ලාන් - වැඩබලන USAID අධ්‍යක්ෂක නීල් ඉද්දවල මහතා, පාර්ලිමේන්තුවේ නියෝජ්‍ය මහ ලේකම් විසින් දියත් කරන ලදී.

1 ඡායාරූපය: COPA සභාපති - ගරු ලසන්ත අලගියවන්න, කථානායක - ගරු කරු ජයසූරිය, USAID වැඩබලන අධ්‍යක්ෂක - රීඩ් අයෂම්ලාන්, පාර්ලිමේන්තු මන්ත්‍රී හර්ෂණ රාජකරුණා මහතා පාර්ලිමේන්තු සඵලතාවය ශක්තිමත් කරන සමුළුව ආරම්භ කරමින්.

2 ඡායාරූපය: මෙම සමුළුව තුළ දී නව කමිටු සාමාජිකයින් අත්දැකීම් බෙදාහදා ගත් අතර වෙනත් රටවල සාර්ථක උදාහරණ උගත් අතර, අනාගත ප්‍රමුඛතාද හඳුනා ගත්හ.